# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.06.08 පැය 1935 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/928 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ගිරිඋල්ල පොලිස් වසමේ පිහිටි මා ඔය පාලම මතින් වාහන ගමනාගමනය සීමා කිරීම.**

“දිට්වා” සුළි කුණාටුව හේතුවෙන් මා ඔයේ ජල පහරට ගසා ගෙන එන ලද උණ පඳුරු, ගස් මුල් මා ඔයේ පාලමේ සිරවීම හේතුවෙන් එම සුන්බුන් ඉවත් කිරීම 2026.06.09 දිනටත් සිදුකරන බවට නිට්ටඹුව මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු අංශය විසින් දැනුම් දී ඇත.

ඒ අනුව, ඉහත දින උදැසන 0800 සිට සවස 0500 දක්වා කාලය තුළ මෙම සුන්බුන් ඉවත් කිරීමේ කටයුතු සිදුකරන බැවින් මා ඔය පාලම මතින් ගමන් ගන්නා සියළුම රථවාහන සඳහා විකල්ප මාර්ග භාවිතා කරන ලෙස රියැදුරන් හා මහජනතාවගෙන් පොලිසිය ඉල්ලා සිටියි.

**විකල්ප මාර්ග**

- **පන්නල දෙස සිට ගිරිඋල්ල පාලම හරහා කොළඹ 05 මාර්ගයට පිවිසෙන රථවාහන බෝපිටිය, මැල්ලවලාන හන්දියෙන් කොටදෙනියාව මාර්ගය ඔස්සේ කොළඹ 05 මාර්ගයට ඇතුළුවීම.**

- **කුරුණෑගල දෙස සිට කොළඹ 05 මාර්ගයට පිවිසෙන රථවාහන මාහරගම, බෝයවලාන හන්දිය, නවතල්වත්ත, අඹෙපුස්ස, කණ්ඩලම හරහා ගිරිඋල්ල මාර්ගයට පිවිස හද්දමුල්ල හන්දියෙන් කොළඹ 05 මාර්ගයට පිවිසිය හැකිය.**

- **කොළඹ දෙස සිට ගිරිඋල්ල පාලම හරහා කුරුණෑගල දෙසට හා ගිරිඋල්ල නගරයට පැමිණෙන රථවාහන හද්දමුල්ල හන්දියෙන් මීරිගම මාර්ගයට පිවිස කණ්ඩලම, අඹෙපුස්ස ගොවිපොල, නවතල්වත්ත, බෝයවලාන, මාහරගම හරහා කුරුණෑගල මීගමුව මාර්ගයට පිවිසිය හැකිය.**

- **කොළඹ, නිට්ටඹුව දෙස සිට මීගමුව මාර්ගයට පැමිණෙන රථවාහන කොටදෙනියාව ඔරලෝසු කණුව අසළින් මැල්ලවලාන මාර්ගය භාවිතා කර මීගමුව මාර්ගයට පිවිසිය හැකිය.**

ඉහත නිවේදනය මහජනාතාවගේ සහ රියැදුරන්ගේ දැනගැනීම සඳහා ඔබ මාධ්‍ය ආයතනය මඟින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**